**හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව**

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 29 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 ජූනි 08 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූනි 24 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ,මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට හොරොව්පොතාන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබද අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පර්චස් 15 සහ 10 ප්‍රමාණවලින් යුත් ඉඩම් 02 ක ඉදිකර තිබුණු ජල ව්‍යාපෘති 03 ක වටිනාකමවූ රු.6,000,000 ක් ස්ථාවර වත්කම් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

(ආ) පුර නැගුම ව්‍යාපෘතිය යටතේ ඉදිකර තිබෙන රු.40,276,055 ක්වූ ගොඩනැගිලි වටිනාකම ස්ථාවර වත්කම් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) සභාව සතු කාර්යාල ගොඩනැඟිල්ල, කඩකාමර, වෙළඳසංකීර්ණ, මහජනවැසිකිලි පද්ධතිය, පුස්තකාල ගොඩනැගිලි හා ගොඩනැගිලි පිහිටි භූමිවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

**02 මූල්‍ය සමාලෝචනය.**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදමට වැඩි ආදායම රු.47,115 ක්වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වැඩි ආදායම රු.1,071,814 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය.**

**2.2.1 වරිපනම් බදු**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තියෙන් ලේකම්වරයාට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කර 2014 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි රු.157,731 ක්වූ වරිපනම් බදු සමාලෝචිත වර්ෂය තුල අයකර ගෙන නොතිබුණි.

**2.2.2 කඩකුලී**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තියෙන් ලේකම්වරයාට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කර 2014 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි රු.1,373,330 ක්වූ කඩකුලී සමාලෝචිත වර්ෂය තුල අයකර ගෙන නොතිබුණි.

**2.2.3 බලපත්‍ර ගාස්තු**

පසුගිය වර්ෂවලට අදාල රු1,038,750 ක්වූ හිඟ බලපත්‍ර ගාස්තු ආදායම අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

**2.2.4 වෙනත් ආදායම්**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 ජේදයේ (2) වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කර 2014 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.621,500 ක්වූ හිඟහිටි කසල බදු ආදායම සමාලෝචිත වර්ෂය තුල අයකර ගෙන නොතිබුණි.

**03. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 නිෂ්ක්‍රීය වත්කම්**

එකතු වටිනාකම රු.1,064,000 ක්වූ සහල්පිටි ආශ්‍රිත බේකරි නිෂ්පාදන උපකරණ සහ එම ගොඩනැගිල්ල අපේක්ෂිත කාර්යයන්ට යොදා ගැනීමකින් තොරව වර්ෂ ගණනාවක් තිස්සේ නිශ්කාර්යව පැවතුණි.

**3.2** **ව්‍යාපෘති ප්‍රමාද කිරීම**

-----------------------

2011 වර්ෂයේ ජාතික සවිය ගමනැගුම වැඩ සටහන යටතේ වැඩ ආරම්භ කරන ලද වාහල්කඩ ජාතික ජල යෝජනා ක්‍රමය සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින විට රු.3,544,028 ක් වැයකර තිබුණි. මෙම ජල යෝජනා ක්‍රමයට අදාල ඉදිකිරීම්වල දුර්වලතාවයන් හේතුවෙන් 2016 වර්ෂයේ අප්‍රේල් මාසය වනවිටද ප්‍රදේශයේ ජනතාවට ජලය ලබාදීමට නොහැකි වී තිබුණි.

**04.** **පද්ධති හා පාලනය**

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම